සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

52 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 12 - 2019

විභාග අංකය .................................  **නර්තනය (දේශීය) I**  කාලය පැය දෙකයි

**වැදගත්**

**අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.**

❖ **උපදෙස් : මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. නුවණට අධිපති දෙවි කෙනෙක් පිළිබඳව වර්ණනා කෙරෙන වන්නමකි.
1. ගණපති වන්නම  2. සුරපති වන්නම  3. මයුරා වන්නම
4. ඊරඩි වන්නම  5. වෛරොඩි වන්නම  (.....)

02. දේශීය තාල පිළිබඳව ඩබ්.බී. මකුලොලුව මහතා හා සරත් විජේවර්ධන මහතා රචනා කරන ලද කෘති දෙකකි.
1. හෙළ ගී මඟ හා තාල ඥානය  2. හෙළ ගී මඟ හා සිංහල තිත් තාල ක්‍රමය
3. තාල ඥානය හා හෙළ ගී මඟ  4. සිංහල තිත් තාල ක්‍රමය හා උඩරට තාල ශාස්ත්‍රය
5. හෙළ ගී මඟ හා උඩරට තාල ශාස්ත්‍රය  (.....)

03. පණ්ඩුකාභය රජ තෙමේ දෙව් මිනිස් නැටුම් කරවමින්.... යනුවෙන් සඳහන් කරන්න.
1. චූලවංශයේ ය.  2. ථූපවංශයේ ය.  3. මහාවංශයේ ය.
4. දීප වංශයේ ය.  5. සමන්ත පාසාදිකාවේ ය.  (.....)

04. උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ගේ නර්තන අංග අනුපිළිවෙලින්,
1. යක්තුන්පදය, කොහොඹ හැල්ල, ශුද්ධ මාත්‍රය  2. අස්නේ, කොහොඹාහැල්ල, මුල් මාත්‍රය
3. අස්නේ, මුල් මාත්‍රය. ශුද්ධ මාත්‍රය  4. මුල් මාත්‍රය, ශුද්ධ මාත්‍රය, මංගලම්
5. මංගලම් ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රය  (.....)

05. චූලවංශයෙ සඳහන් පරිදි පොළොන්නරු යුගයේ දී, නවග්‍රහ බලි ශාන්ති කර්මය කරවන ලද්දේ කවුරුන් විසින්ද?
1. මහා පරාක්‍රමබාහු රජු විසිනි.  2. නිශ්ශංක මල්ල රජු විසිනි.
3. දුටුගැමුණු රජු විසිනි.  4. පණ්ඩුකාභය රජු විසිනි.
5. පඬුවස්දෙව් රජු විසිනි.  (.....)

06. සරත බීජාක්ෂර මුල් කරගත් කස්තිරමක් දක්නට ලැබෙන්නේ,
1. චන්ද්‍රිකා සරඹයෙහි ය.  2. බඹර සරඹයෙහි ය.  3. දෑත පෑගීමේ සරඹයෙහි ය.
4. අර්ධ චක්‍ර සරඹයෙහි ය.  5. අංගහාර සරඹයෙහි ය.  (.....)

07. කිරිමඩු ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරුන් ලෙස සැළකෙන්නේ,
1. පත්තිනි, දෙවොල්, හා වාහල  2. මංගර, දෙවොල් හා පත්තිනි  3. පත්තිනි මංගර හා දෙවොල්
4. මංගර පත්තිනි හා විෂ්ණු  5. පත්තිනි වාහල හා වීරමුණ්ඩ  (.....)

08. යාපහුවේ දළදා මාලිගාවේ සෙල්මුවා වා කවුළුවක දක්නට ලැබෙන්නේ,
1. භරත නර්තන කරණ විලාශයකි.
2. කතකලි නර්තන විලාශයෙනි.
3. කථක් නර්තන විලාශයකි.
4. මනිපුරි නර්තන විලාශයෙනි.
5. පහතරට නර්තන විලාශයකි. (.....)

09. රස නිෂ්පත්තියට හේතුවන භාව අටක් ලෙස සඳහන් කොට ඇත්තේ,
1. භරත මුණිවරයාගේ නාට්‍යශාස්ත්‍රයේ ය.
2. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයේ ය.
3. නන්දිකේශ්වරගේ අභිනය දර්ශනයේ ය.
4. වෝල්ටර් මාරසිංහගේ භරතමුණි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍රයේ ය.
5. සේනාරත්න පතිරණගේ අභිනය දර්ශපනයේ ය. (.....)

10. සිංහල ගැමි නැටුම්වලට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් නිවැරදිව සඳහන් වර්ණය තෝරන්න.
1. කළ - චෙම්බු, ලී කෙළි - අරිවිවෙට්ටු
2. කළ - චෙම්බු, සුලකු - අරිවිවෙට්ටු
3. කුළු - කෝලාට්ටම්, ලී කෙළි - සුලකු
4. ලී කෙළි - කෝලාට්ටම්, කුළු - සුලකු
5. ලී කෙළි - කෝලාට්ටම්, කළ - සුලකු (.....)

11. නළඟන රූපයක් සහිත ඇත්දත් කැටයමක් දක්නට ලැබෙන්නේ,
1. දෙගල්දොරුවේ රජමහා විහාරයේ ය.
2. යාපහුවේ දළදා මාළිගයේ ය.
3. රිදී විහාරයේ දොරෙහිය.
4. අනුරාධපුරයේ කුට්ටම් පොකුණේ ය.
5. කුරුණෑගල ඇත්කඳ විහාරයේ ය. (.....)

12. නාට්‍ය ශාස්ත්‍රයට අනුව ව්‍යභිචාරීභාව ගණනින්,
1. දහඅටකි.
2. විසිහතරකි.
3. තිස්දෙකකි.
4. හැටහතරකි.
5. තිස් තුනකි. (.....)

13. ඒ බුදු රැස් කඳ තුන් ලොව විහිදූ .................. මෙය,
1. පන්තේරු කවියකි.
2. උඩැක්කි කවියකි.
3. ලී කෙළි කවියකි.
4. සවරන් කවියකි.
5. චාමර කවියකි. (.....)

14.



A B

ඉහත සඳහන් රූපවල රසභාව අනුපිළිවෙලින්
1. වීර හා අත්භුත රසය වේ.
2. භයනාක හා ශාන්ත රසය වේ.
3. වීර හා කරුනා රසය වේ.
4. භීබත්ස්‍ය හා ශාන්ත රසය වේ.
5. භයානක හා භීබත්ස්‍ය රසය වේ. (.....)

15. මංගර දෙවියන් සම්බන්ධ කතා පුවත ඇතුළත් ශාන්ති කර්මය ලෙස සැලකේ.
1. පහන් මඩුව
2. කිරි මඩුව
3. ගී මඩුව
4. ගිනිමඩුව
5. දෙවොල් මඩුව (.....)

16. ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය විසින් රචිත කෘතියකි.
1. සරබගමු නර්තන කලාව
2. කිරිමඩුව ශාන්ති කර්මය
3. වලියක් මංගල්‍ය විමසුම
4. සිංහල නර්තන කලාව
5. සිංහල සැරසිලි කලාව (.....)

17. කමත් භාෂා ව්‍යවහරයේ දී යතුර යනුවෙන් භාවිතා වන්නකි.
1. වියගහ 2. කුල්ල 3. දැකැත්ත 4. බෝල අත්ත 5. පැදුර (.....)

18. ගද්‍ය හා පද්‍ය කොටස් දෙකකින් ප්‍රබන්ධ වී ඇති ගායනා විශේෂයකි.
1. ටීකා සී පද 2. නෙළුම් කවි 3. පතල් කවි
4. පාරු කවි 5. ප්‍රශස්ති කවි (.....)

19. කිරිමඩු ශාන්තිකර්මයේ දැක්වෙන සුවිශේෂී ගායනයකි.
1. කොහොඹා හෑල්ල 2. නුගේ හෑල්ල 3. ගණදෙවි හෑල්ල
4. පත්තිනි හෑල්ල 5. විෂ්ණු හෑල්ල (.....)

20. සූවිසි විවරණ, සත්සති, පන්සාලිස්වස වැනි ආගමික අවස්ථාවලදී යොදාගනු ලබන උඩරට නර්තනයට සුවිශේෂී වූ ගායන සහිත නර්තන විශේෂයකි.
1. පන්තේරු 2. උඩැක්කි 3. වන්නම්
4. ප්‍රශස්ති 5. රබන් (.....)

21. උඩැක්කියට සුවිශේෂී වූ කොටස් වේ.
1. සවරම් පටිය, කිතුල් තත හා වලයම 2. කඩිප්පු හඬබෑය හා කිතුල් කත
3. වෙංගායම් මුද්ද, සවරම් පටිය හා මණ්ඩම 4. වෙනිවැර කැරැල්ල, කයිපුඩුවලල්ල හා කංවරය
5. ගිගිරි වළල්ල, සවරම් පටිය හා වලයම (.....)

22. ලොව සෙත් කරවන පත්තිනි සඳිනේ ..... යන කවිය අයත් ගැමි නැටුම වන්නේ,
1. කුළු නැටුම 2. මෝල්ගස් නැටුම 3. පතුරු නැටුම
4. ලී කෙළි නැටුම 5. කළගෙඩි නැටුම (.....)

23. තාත් ජිංත ජිංත ජිං .......... යන අඩව්ව නර්තනය කළ හැකි වන්නමකි.
1. මයුරා වන්නම 2. මුසලඩි වන්නම 3. සුරපති වන්නම
4. ගණපති වන්නම 5. ගජගා වන්නම (.....)

24. ආදී මානවයාගේ නර්තන කලාව පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි ප්‍රාග් ඓතිහාසික සාධක දෙකකි.
1. සිසිලියේ සහ ස්පාඤ්ඤයේ මොරෙල්ලා ශිලා ගුහා චිත්‍ර
2. පාලාමොට්ටායි සෙල්ලිපිය සහ සීගිරි ශිලා ගුහා චිත්‍ර
3. ලක්සෝර් කඳුවැටි වල ඇඳ ඇති යුගල නැටුම් සහ යාපහුවේ වාමන රූප
4. කුට්ටම් පොකුණේ නලඟන රූපය හා කොංගෝ ග්‍රෝත්‍රිකයන්ගේ නර්තන
5. කොරවක්ගල් ලෙන් ලිපිය සහ මොරෙල්ලා ගුහා චිත්‍ර (.....)

25. සැපත පැමිණි මුළු ලොවට සියල්ලේ..... යන කවි පාදයේ ඇති ලඝු මාත්‍රා ගුරු මාත්‍රා හා සැදැස්මස් සංඛ්‍යාව වන්නේ,
1. ලඝු මාත්‍රා 12 ගුරුමාත්‍රා 04 සැදැස්මස් 20 කි. 2. ලඝු මාත්‍රා 10 ගුරුමාත්‍රා 02 සැදැස්මස් 14 කි.
3. ලඝු මාත්‍රා 08 ගුරුමාත්‍රා 04 සැදැස්මස් 12 කි. 4. ලඝු මාත්‍රා 14 ගුරුමාත්‍රා 02 සැදැස්මස් 18 කි.
5. ලඝු මාත්‍රා 12 ගුරුමාත්‍රා 04 සැදැස්මස් 16 කි. (.....)

◈ **26 - 30 තෙක් හිස්තැන් වලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. දෙවන පරාක්‍රමබාහු රජතුමා උගත් කලාවන් ගැන දක්වන තැන භරත යන්න සඳහන් කොට ඇත්තේ ............................................................................... අස්නෙහි ය.

27. ''සිරිවස ගෙන අසු නැගෙමින් නොලෙසා .............' මෙහි සඳහන් සිරිවස යනු .................................... යි.

28. ගත්දිත් තත් දොං තකු දොං රුද ගුද ග - ත - ක දිමි දිමි දැහිං මෙය ශුද්ධ මාත්‍රයේ ............................................... පදයයි.

29. ආධුනිකයෙකු මූලික සරඹ අභ්‍යාසයේ දී තම්මැට්ටම වෙනුවට ............................................... යොදා ගනියි.

30. කොතල පදය නර්තනයේ දී රංග භාණ්ඩයක් ලෙස ...................................................... යොදා ගනී.

31. කාවඩි නර්තනයේ දී තවිල් බෙරය සමඟ ....................................................... යන සුසර භාණ්ඩය යොදාගනී.

32. අදහස් ප්‍රකාශනය සඳහා සාත්වික අභිනයේ දී ශරීරයේ ............................................... කොටස් යොදා ගනී.

33. ද්‍රවිඩ ජනයා විසින් නර්තය කරනු ලබන .................................................... තේ දළු නෙළීමේ වෘත්තිය ඇසුරින් සැකසුනු ගැමි නර්තනයකි.

34. වල්ලිය, හවඩි දඟය, ලණු දඟරය, යනු ................................... නැටුමේ දක්නට ලැබෙන සුවිශේෂ අවස්ථාවන් ය.

35. කිරිමඩු ශාන්තිකර්මයේ එන ඇත්බන්ධන හා මී බන්ධන අවස්ථාවලදී ඇති සහ මීමා නිරූපණය කරනු ලබන්නා ....................................... නමින් හැඳින්වේ.

◈ **36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ කෙටි පිළිතුරු සපයන්න.**

36. ඇම්බැක්කේ දේවාලයේ කැටයම් සහ මහනුවර දේශාටන වාර්තා ඇසුරින් එකල පැවති බව කිව හැකි ගැමි නැටුම් දෙකකි.
I. ........................................................................... II. ........................................................................

37. නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු විමසීමේදී ඒ පිළිබඳ සුවිශේෂ වූ මූලාශ්‍ර දෙක නම් කරන්න.
I. ........................................................................... II. ........................................................................

38. 'සුරතට රැගෙන පන්දම යාගෙට ඇඳුරා - වමතට විදුරු මිණියක් රැගෙන නද කරා''
මෙහි සඳහන් පරිදි බලි ඇසරා විසින් භාවිතා කරනු ලබන රංග භාණ්ඩ දෙක නම් කරන්න.
I. ........................................................................... II. ........................................................................

39. තුන්සුළු දෙමහා පස්තිත නර්තනය කරනු ලබන උඩරට හා සබරගමු නර්තන අංග දෙක කුමක්ද?
I. ........................................................................... II. ........................................................................

40. කිරිමඩු ශාන්ති කර්මයේ එන ප්‍රදාන සැරසිලි දෙකකි.
I. ........................................................................... II. ........................................................................

41. ස්ථායි භාවයන් අවධි කිරීමට මුල්වන විභාව කොටස් දෙක නම් කරන්න.
I. ........................................................................... II. ........................................................................

42. රණකාමීත්වය දනවන එකල රචනා වූ හටන් කාව්‍ය දෙකක් ලියා දක්වන්න.
I. ........................................................................... II. ........................................................................

43. භරත මුණිවරයා විසින් ඉදිරිපත් කර ඇතිරංග ශෛලීන් දෙක නම් කරන්න.
I. ........................................................................... II. ........................................................................

44. බෙර වාදනයේ දී මූලික කොට ගනු ලබන අක්ෂර වර්ග දෙක නම් කරන්න.
I. ........................................................................... II. ........................................................................

45. කිරිමඩු ශාන්තිකමර්යේ උපත් කථාවේ දැක්වෙන මායාරටේ මායා රජුගේ අගමෙහෙසිය හා පුත්කුමරු කවුරුන්ද?
I. අග මෙහෙසිය ............................................................ II. පුත් කුමරු .....................................................

46. තාලානුකූලව යෙදෙන ගායනා සහ තාලානුකූල නොවන ගායනා හැඳින්වෙන ආකාරය ලියා දක්වන්න.
I. තාලානුකූල ගායනා - .............................................
II. තාලානුකූල නොවන ගායනා - .............................................

47. දෙපානෝ හා කරදිය අයත් නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න.
I. දෙපානෝ ............................................... II. කරදිය ...............................................

48. නූතන වේදිකාවට ගොයම් නැටුම සහ මෝල්ගස් නැටුම සකස්කළ ශිල්පීයා හා ශිල්පීනිය කවුරුන්දැයි නම් කරන්න.
I. ගොයම් - ................................................ II. මෝල්ගස් - ........................................

49. පහත සඳහන් කවියේ හිස්තැන්වලට අදාළ පද කොටස් ලියා කවි පදය සම්පූර්ණ කරන්න.
රත් පියුම් වැනි මුඛ ........................................................................... කුඹු රමනා

50. 'රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට - විදුරු තර ැදෙකක් මෙන් නෙත් රැවී යමට ''
ඉහත කවියෙන් මතුවන රසය හා භාවය ලියා දක්වන්න.
I. රසය ..................................................... II. භාවය .....................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

52 | S | II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය ................................. නර්තනය (දේශීය) II කාලය පැය තුනයි

වැදගත්

I වන කොටසෙහි 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. II, III, කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. (i) මංගලම් / මුල් මාත්‍රය / ශුද්ධ මාත්‍රය යන නර්තන අංග අතුරින් එක් අංගයකට අයත් බෙර පදක් සහ කවි පදයක් ප්‍රස්තාර කරන්න.

 (ii) පහත සඳහන් කවි පද දෙක අදාල තිත් රූපයට (අවග්‍රහයට) අනුව ප්‍රස්තාර කරන්න.
 ''සුගත් දහම් සඟ රත්නෙ වැඳිල්ලා - රැගත් සුරන් සැම දෙවි ඇදහිල්ලා''

 (iii) ගණපති වන්නමට අයත් අඩව්වක් ප්‍රස්තාර කරන්න.

02. දේශීය නර්තන කලාවේ විකාශය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී අපේ ජාතික උරුමයන් පිළිබඳව දැනුමක් ලබා ගත හැකි වේ

 (i) දේශීය නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු දැක්වෙන අනුරාධපුර, පොළොන්නරු සහ දඹදෙණි යුගයන්ට අයත් සාධක තුනක් (03) ක් දක්වන්න.

 (ii) අනුරාධපුර යුගයේ දී විවිධ ආගමික කටයුතු සඳහා නර්තනය යොදා ගත් ආකාරය සාධක දෙකක් ඇසුරින් විස්තර කරන්න.

 (iii) පොළොන්නරු යුගයේ නර්තන කලාව සම්බන්ධව හමුවන පුරා විද්‍යාත්මක සාධක ජාතික උරුමයන් ලෙස රැක ගතයුතු බවට අදහස් දක්වන්න.

## II කොටස

03. කෘෂිකාර්මික ජන ජීවිතය තුළ කිරිමඩු ශාන්ති කර්මයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි.

 (i) කිරිමඩු ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පදනම් කරගනිමින් ඉහත කියමන සනාථ කරන්න.

 (ii) වෛරය හා ක්‍රෝධය විනාශයට මුල්වන බව කිරිමඩු ශාන්ති කර්මයේ උපත් කථාව ඇසුරින් පැහැදිලි කරන්න.

 (iii) සමාජ සාරධර්ම හා සහජීවනය වර්ධනයෙහිලා කිරිමඩු ශාන්ති කර්මය පැවැත්වීමෙන් ලැබෙන පිටුවහල විමසන්න.

04. දේශීය ශාන්ති කර්මය වූ කලී ගායන, වාදන, නර්තන මෙන්ම විවිධ සැරසිලිවලින් ද අනූන සංස්කෘතිකාංගයකි.

(i) කිරිමඩු ශාන්ති කර්මයට සුවිශේෂී වූ ගායන, නර්තන හා නාට්‍යමය අවස්ථා දෙක බැගින් සඳහන් කරන්න.

(ii) කිරිමඩු ශාන්ති කර්මයේ එන ප්‍රධාන සැරසිලි දෙක පිළිබඳ විස්තරයක් කරන්න.

(iii) ඇත් බන්ධන හා මී බන්ධන අවස්ථාවේදී යකදුරන්ගේ බාහිර සමාරෝපය පැහැදිලි කරන්න.

05. ලොව සෑම ජන කොට්ඨාසයකටම ආවේනිකව ජන කලාවක් පවතී.

(i) ලාංකීය ජන සමාජය තුළ සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්, ගායනා, ඇදහිලි හා විශ්වාස සමඟ සම්බන්ධව පවත්නා අයුරු ගැමි නැටුම් දෙකක් ඇසුරින් විමසන්න.

(ii) ජීවන වෘත්තීන් ඇසුරින් නිර්මාණය වී ඇති සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් උදාහරණය සහිතව විස්තර කරන්න.

(iii) සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම්වල සමාන අසමානතා තුලනාත්මක විවරණය කරන්න.

## III කොටස

06. රස භාව යනු පෙර අපර විද්වතුන්ගේ අවධානයට ලක් වූ සුවිශේෂී සංකල්පයකි.

(i) නව නළු රස හා ඒවාට මුල් වන ස්ථායි භාවයන් ලියා දක්වන්න.

(ii) රස නිෂ්පත්තියට බලපාන සාධක පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) දේශීය ශාන්ති කර්මවල එන චරිත නිරූපණයන්හි දී රස භාව තීව්‍ර කිරීමට භාවිතා කර ඇති විධික්‍රම මොනවාදැයි විමසන්න.

07. නර්තනය හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇත්තේ මනා සබඳතාවයකි.

(i) නාට්‍ය ශෛලීන් හතරක් නම් කොට ඉන් දෙකක් පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

(ii) රූපණය සඳහා නර්තනය යොදාගන්නා අයුරු පැහැදිලි කරන්න.

(iii) දේශීය ගැමි නාටකවල චරිත නිරූපණයේදී නර්තනය මාධ්‍ය කොටගෙන ඇති ආකාරය විමසුමට ලක් කරන්න.

08. ප්‍රාසාංගික ඉදිරිපත් කිරීමකදී රංග වින්‍යාසය වැදගත් සාධකයකි.

(i) රංග වින්‍යාසය යන්න පැහැදිලි කරන්න.

(ii) වේදිකා නර්තනයක ප්‍රාසාංගික බව තීව්‍ර කරගනැනීමට රංග වින්‍යාසය ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

(iii) රංග වින්‍යාසය භාවිතා කර ඇති ආකාරය ශාන්ති කර්මයක නර්තන අවස්ථාවක් ඇසුරින් විමර්ශණය කරන්න.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
දෙවන වාර පරීක්ෂණය - 2019

**12 ශ්‍රේණිය** | **නර්තනය I** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | |
|---|---|---|
| **01.** - 1 | **11.** - 3 | **21.** - 1 |
| **02.** - 2 | **12.** - 5 | **22.** - 3 |
| **03.** - 3 | **13.** - 2 | **23.** - 4 |
| **04.** - 5 | **14.** - 4 | **24.** - 1 |
| **05.** - 2 | **15.** - 2 | **25.** - 5 |
| **06.** - 1 | **16.** - 1 | |
| **07.** - 4 | **17.** - 2 | |
| **08.** - 1 | **18.** - 1 | |
| **09.** - 1 | **19.** - 1 | |
| **10.** - 4 | **20.** - 1 | |

26. දඹදෙණි 27. උඩැක්කිය 28. බර 29. කොට්ටබිස්ස
30. කොතලය 31. නාදස්වරම්/නාගස්වරම් 32. උපාංග 33. කොළඳු පරිතාල්
34. ලී කෙළි 35. නෙල්ලි කොත්තුවා
36. I ලීකෙළි නැටුම II කළගෙඩි නැටුම් 37. I. සාහිත්‍ය මූලාශ්‍රය II. පුරා විද්‍යාත්මක මූලාශ්‍රය
38. I පන්දම II. අත්මිණිය, වජ්‍රාමිණිය/ගගනය
39. I . මංගලම් නැටුම II. මුල් මාත්‍රය
40. I. මල්යහනාව II. කිරිමැස්ස
41. I. ආලම්බන විබාව II. උද්දීපන විභාව
42. I. පරංගි හටන, ඉංග්‍රීසි හටන, ඇහැලේපොළ හටන, ලන්දේසි හටන, ආදී වශයෙන් හටන් දෙකක් නම්කර ඇත්නම් ලකුණු දෙන්න.
43. I. නාට්‍ය ධර්මී II. ලෝකධර්මී 44. I. බීජාක්ෂර II. ගර්භාක්ෂර
45. I. අගමෙහෙසිය - වර්ණ II. පුත්කුමරු - බුදුසිරි කුමරු 46. I. අසාතාත්මක II. අනාසාතාත්මක
47. I. ගීතනාට්‍ය II. මුද්‍රානාට්‍ය
48. I. එස්.පණීභාරත මහතා II. මිරැන්ඩා හේමලතා මහත්මිය
49. I. 'යුත් සවන් ලෙළදෙන - නෙත් අඳුන් නිල්මිණි 50. I. රසය :- භයානක භාවයඃ- භය

## II පත්‍රය - I කොටස

1) i නිවැරදිව තාල රූපවලට බෙදා දැක්වීම හා නිවැරදි සංකේත භාවිතය - 2
බෙර පදය නිවැරදිව ප්‍රස්ථාර කර තිබීම - 2
තාල පදය නිවැරදිව ප්‍රස්ථාර කර තිබීම. - 2
ලකුණු = 06 යි.

ii

| 1́ 2 3 4 | 1́ 2 3 4 | 1́ 2 3 4 | 1́ 2 3 4 |
|---|---|---|---|
| + සු ගත් ද | හම් - ස ග | රත් - තෙ ක | ළිල් - ලා - |
| + + දත් - | තෙ - වැ - | දිල් - - - | ලා - - - |
| + රැ ගත් සු | රත් - සැ ම | දෙ වි ඇ ද | තිල් - ලා - |
| + + දෙ වි | ඇ - ද - | තිල් - - - | ලා - - - |

නිවැරදි තාල රූප හා සංකේත භාවිතය - 2
තාල පද දෙක නිවැරදිව ප්‍රස්ථාර කිරීම - 4
ලකුණු = 06 යි.

iii) * තාත් තකට තරිකිට දොද් දොං ............... ගත්ත තෙහිගු තකට තකුඳ ............ තාත් ජිංත ජිංත ජිතරි......
මින් එක් අඩව්වක් සම්පූර්ණයෙන් නිවැරදිව ප්‍රස්තාර කර තිබීම.
නිවැරදි තාල රූප හා සංකේත භාවිතය - 02 අඩව්ව සම්පූර්ණයෙන් නිවැරදිව ප්‍රස්තාර කිරීම - 06 (ල. 08)

## II - පත්‍රය සඳහා පිළිතුරු

02. (i) අදාලව සාධක තුනක් දක්වා තිබීම - 2 x 3 = 6
(ii) සාධක නිවැරදි නම් (ල. 02) ආගමික කටයුතු සඳහා යොදාගත් ආකාරය විස්තර කිරීම (ල. 4) (ලකුණු 6)
(iii) නර්තනය සම්බන්ධව හමුවන පුරා විද්‍යාත්මක සාධක තුනක්වත් දක්වා ඇත්නම් (ල. 3)
03 ක් වත් දක්වා ඇත්නම් (ල. 3)
ඒවායෙහි ඇති පුරා විද්‍යාත්මක, සංස්කෘතිකමය වටිනාකම අගයමින් ජාතික උරුමයන් සේ රැක ගත යුතු බවට කරුණු දක්වා තිබීම (ල. 8)

03. (i) කෘෂිකර්මාන්තයේ දී ගවයා ප්‍රධාන තැනක් ගන්නා බව, ඊට අමතරව කිරි, ගොම ආදිය ලබා ගන්නා බව, ගවයා සශ්‍රීකත්වය දක්වන සංකේතයක් බවා, ගව සම්පතක් ලෙස සලකා රැකගැනීමේ අරමුණින් කිරි මඩු ශාන්ති කර්මය පවත්වන බව (ල. 06)
(ii) පෙර ආත්මයක සිට මධුර මායා කුමරු සහ බුද සිරු කුමරු අතර පවත්නා වෛරය, මධුර මායා කුමරු මීමෙකු වෙස් ගෙන පැමිණීම ඔවුන් දෙදෙනා අතර ඇතිවන ආරවුල, බුද සිරු කුමරු මරණයට පත්වීම. මේ ආදී කරුණු ඇසුරින් වෛරය, ක්‍රෝධය විනාශයට මුල් වන ආකාරය දක්වා තිබීම. (ලකුණු 6)
(iii) කෘෂිකාර්මික ජීවන රටාව තුළ ගවයා පොදු සම්පත් බව, පොදුවේ ලෙඩ රෝග නිවාරණය, මුළු ගමටම සෞභාග්‍ය පතා පවත්වනු ලබන බව, උස් පහත් භේදයකින් තොරව සියළු දෙනාට ම සමානව සලකන බව (කහ රොටී දානය) මෙසේ පොදු කටයුත්තක් ලෙස සියළු දෙනා ඒකරාශී වීම තුළින් සහ ජීවනය සහ සාරධර්ම ගොඩ නැගෙන බව. (ල. 08)
(මුළු ලකුණු 20)

04. (i) ගායන - මංගර හැල්ල, නුගේ හැල්ල
නර්තන - දේව කෝල්පාඩුව, මල් පද, සමයං පද
නාට්‍යමය අවස්ථා - අත් බන්ධනය, මී බන්ධනය, යනාදියෙන් දෙක බැගින් සඳහන් කර තිබීම. (ල. 06)
(ii) මල් යහනාව සහ කිරි මැස්ස කෙටියෙන් හඳුන්වා තිබීම. (ලකුණු 6)
(iii) ඇතා සහ මීමා නිරූපණය කරන්නා 'නෙල්ලි කොතුවා නමින් හඳුන්වන බව, කොළපතකින් සකස් කර ගන්නා වෙස් මුහුණක් පළඳින බව, හිස සුදු රෙද්දකින් ආවරණ කර ගන්නා බව. ගත සුදු රෙද්දකින් වසා, අඹරා ගත් සුදු රෙද්ද අගට පුවක් මල් කිනිත්ත් බැඳ ඇතාගේ වලිගය සකස් කර ගන්නා බව. මෙසේ ඇතා සහ මීමා ලෙස සමාරෝපනය වන බව දක්වා තිබීම. (ල. 08) (මුළු ලකුණු 20)

05. (i) නිවැරදිව නර්තන අංග දෙක තෝරා ගෙන තිබීම. (ල. 2)
නර්තන අංග දෙක විස්තර කිරීම 2 x 2 (ල. 04)
(ii) **සමානකම් ලෙස** ආගමික පසුබිමක් සහිත බව, විනෝදාස්වාදය මුල් කර ගන්නා බව, ජීවන වෘත්තීන් පදනම් වී ඇති බව, සරල භාෂාව, සංගීතය, රංග වස්ත්‍ර භාවිතය, එක හා සමාන ගැමි නැටුනුම් පවතින බව
අසමානකම් ලෙස ඒ ඒ සංස්කෘතියට අදාලව ඇදහිලි හා විශ්වාස පවත්නා බව, සංගීතය, රංග උපකරණ, සංචලන, රංග වස්ත්‍රාභරණ භාවිතා වන බව උදාහරණ ද සහිතව දක්වා තිබීම. (ලකුණු 6)
(iii) ඒ ඒ සංස්කෘතීන්ට අදාලව දෙවිවරුන් ඇදහීම් ස්වභාවික වස්තුන් දේවත්වයෙන් සැලකීම ඒ සඳහා ගායනා හා නර්තන අංග සකස් වී ඇති ආකාරය උදාහරණ දක්වමින් විමසා තිබීම (ල. 08) (මුළු ලකුණු 20)

06. (i) නව නළු රස හා භාව නිවැරදිව දක්වා තිබීම. (ලකුණු 6)
(ii) විභාව, අනුභාව, ව්‍යභිචාරී භාව සංයෝගයෙන් රස නිෂ්පත්තිය සිදුවන ආකාරය විස්තර කර තිබීම. (ලකුණු 6)
(iii) සුවිශේෂ දෙබස්, සංවාද භාවිතය, කෙටි කවි මගින් චරිත හඳුන්වා දීම, චරිතවලට ආවේනික ගමන් පද, බෙර පද යොදා ගැනීම, වෙස් ගැන්වීම, සැරසිලි රංග භාණ්ඩ භාවිතය යනාදී කරුණු උදාහරණ සහිතව දක්වා තිබීම. (ලකුණු 8)
(මුළු ලකුණු 20)

07. (i) නාට්‍ය ශෛලීන් හතරක් නිවැරදිව නම් කිරීමට (ල. 02)
දෙකක් පිළිබඳව කෙටි සටහන් ලිවීම 2 x 2 (ල. 04) (ලකුණු 6)
(ii) නාට්‍යකදී හෝ ශාන්ති කර්ම අවස්ථාවකදී හෝ කිසියම් සිද්ධියක් අනුකරණය කර දැක්වීමේදී ප්‍රකාශනය තීව්‍ර කිරීම හා ප්‍රාසාංගික ගුණය පවත්වා ගැනීම සඳහා තාලානුකූල, රිද්මයානුකූල හා ප්‍රකාශනාත්මක චලන වශයෙන් නර්තනය මාධ්‍ය කොට ගන්නා බව පැහැදිලි කර තිබීම. (ල. 06)
(iii) සුවිශේෂ බෙර පද, ගමන් තාල, නර්තන සංචලන. ගායනා අනුව කෙරෙන අනුරූපන උදාහරණ දෙමින් විමසුමට ලක් කර තිබීම. (මුළු ලකුණු 20)

08. (i) රංගනයක හෝ නර්තනයක ආරම්භයේ සිට අවසානය තෙක් රූප රටා පෙළ ගස්වමින්, නළු නිළියන් ශිල්පීන් හසුරවමින්, ආනුෂංගික අංග සංයෝජනය කරමින් රංග කාර්යය සැලසුම් කිරීම රංග වින්‍යාසය වන බව විස්තර කර තිබීම.
(ල. 06)
(ii) ඉහත කරුණු කෙරෙහි සැලකිල්ල යොමු කරමින් පූර්ව සැලසුමක් සහිත වීම තුළින් වේදිකා පාලනය, ශිල්පීන් හැසිරවීම, රංග රටා, තල දිසා භාවිතය, එකිනෙක ගලා යන ආකාරයට සැලසුම් කිරීම මගින් රංග කාර්යයක ප්‍රාසාංගික ගුණය ඉහළ මට්ටමක පවත්වා ගත හැකි බව පැහැදිලි කර තිබීම. (ලකුණු 6)
(iii) රංග රටා, වේදිකා (මඩුව) භාවිතය, සංගිතය (බෙර වාදනය) ගායනය, රංග භාණ්ඩ උපකරණ වේදිකා සැරසිලි යනාදිය හසුරුවනු ලබන ආකාරය ශාන්ති කර්මයක අවස්ථාවක් උදාහරණයට ගෙන විමර්ශනය කර තබීම.
(ලකුණු 8) (මුළු ලකුණු 20)